# ගුණාත්මක බීජ නිෂ්පාදනය හා බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයේ කාර්යභාරය

සුනිල් ගෝවින්නගේ
*සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) පැල්වෙහෙර*

**පොදු භාවිතයේ දී බීජයක් යන වචනයෙන් සිහියට නැගෙන්නේ සිටුවීම සඳහා ගනු ලබන ද්‍රව්‍යයක් ලෙස වුවද. නූතන කෘෂිකර්මය හා සලකන කල්හි බීජයක් යනු ඊට වඩා බැරෑරුම් අරුතක් ලබා දෙන ද්‍රව්‍යයක් බව හඳුන්වා දිය හැක.**

ගොවියාට හිතකර හා ලාභදායක අංගෝපාංග වලින් හෙබි භෝග පැලෑටියක් ඇති වූ පසු එම අංගෝපාංග සියල්ලම එලෙසින්ම පරම්පරා ගණනාවක් තිස්සේ ගෙන යෑමේ හැකියාක් ඇති, සිටුවීම සඳහා භාවිතා කරනු ලබන ද්‍රව්‍යයක් ගුණාත්මක බීජයක් ලෙස හඳුන්වා දිය හැක. පුරාණයේ පටන් ගොවීහු තමාගේ අස්වැන්නෙන් ඉතාම හොඳ කොටසක් වෙන්කර හෝ ක්ෂේත්‍රයේදීම හොඳ ලක්ෂණ සහිත බෝග පැලෑටි වෙන් කර ගෙන ලැබෙන අස්වැන්නෙන් තෝරාගෙන හෝ ඊළඟ කන්නයේ වගාව සඳහා බීජ වෙන් කර ගැනීමට පුරුදුව සිටියහ. අදත් බීජ නිෂ්පාදනයේ මූලික සිද්ධාන්තය මෙයම වේ. නමුත් එදාට වඩා අද මෙම "හොඳ"යයි සලකා බලන ලක්ෂණ සම්බන්ධව තිබෙන අවධානය හා අවබෝධය වැඩිය. මෙම ලක්ෂණ ක්ෂේත්‍රයේ දී ක්ෂණිකව හඳුනා ගැනීමේ ශක්තිය හා ක්ෂේත්‍ර කටයුතුවල දී එම ලක්ෂණ අනූනව පවත්වා ගෙනයෑමේ ශක්තිය මත බීජ නිෂ්පාදනයේ ගුණාත්මක භාවය රඳා පවතී. මෙම ගුණාත්මක භාවය රැකගෙන බීජ නිෂ්පාදනය නො කඩවා පවත්වා ගෙන ගොස් එම බීජ ගොවීන් අතට පත් කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයේ කාර්ය භාරය ලෙස හැඳින්විය හැක.

## බීජ නිෂ්පාදනයේ මූල ධර්ම :

බාහිරව සිතන විට එය සුළු වශයෙන් පෙනුනද, බීජ වලින් තොරව කෘෂිකර්මාන්තයක් ගැන කථා කළ නො හැකිය. කෘෂි කර්මාන්තයේ වැදගත්ම අංගයක් වන බීජ නිෂ්පාදනයේ මූල ධර්ම මෙහිදී අපගේ අවධානයට යොමුවිය යුතු වටිනා ක්ෂේත්‍රයකි.

මුලින්ම ගොවියාට හිතකර වූ අංගෝපාංග වලින් හෙබි බෝග පැලෑටියකින් බීජ නිෂ්පාදන කාර්යාවලිය ආරම්භ වෙයි. එවැනි පැලෑටියක් අහම්බෙන් ඇති වූවක් හෝ දෙමුහුම් කිරීමකින් ඇති කරගත්තක් හෝ විය හැකිය. කෙසේ හෝ ඇතිවන මෙවැනි පැලෑටියක් ක්ෂේත්‍රයේ දී හඳුනාගත් පසුව එයින් ලැබෙන බීජ ඊළඟ කන්නයේ දී සිටුවීම සඳහා භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් ප්‍රථමයෙන් එම පැලෑටිය වෙනත් පැලෑටි සමග ස්වාභාවිකව දෙමුහුම් වීම වැළැක්වීම සඳහා පියවර ගතයුතු වෙයි. මේ සඳහා පැලෑටිය හුදෙකලා කළ හැකිය. නමුත් මෙය සෑම වර්ගයකම පැලෑටි සඳහා අවශ්‍ය වන්නක් නොවේ. සමහර පැලෑටි තමන්ගේම මල්වලින් හටගන්නා පරාග සමග පමණක් පෝෂණය වීමට අනුවර්තනය වී තිබිය හැකිය. මෙවැනි පැලෑටි උද්භිද විද්‍යානුකූලව "ස්වපරාගික ශාඛ" ලෙස හැඳින්වෙන අතර මෙවැනි පැලෑටි සඳහා මෙම හුදකලා කිරීම අවශ්‍ය වන්නේ නැත. කෙසේ වුවද මෙම හුදෙකලා කිරීම වඩාත්ම වැදගත් වන්නේ මල් හටගන්නා විටදීය. එතැන් පටන් තෝරාගත් පැලෑටියට අවශ්‍ය සියළුම රෝපණ ක්‍රම එයට ලබාදිය යුතු අතර අවසානයේ දී එම ඵලවලින් ලැබෙන බීජ ඊළඟ පරම්පරාව ඇති කිරීම සඳහා භාවිතා කළ හැකිය. මෙම බීජ වලින් ඊළඟ පරම්පරාවේ දී ලබා ගන්නා පැලෑටි මව් පැලෑටියේ ලක්ෂණ හා සැසඳෙන්නේ දැයි නිතර නිතර ක්ෂේත්‍ර පරීක්ෂා වලින් සොයා බැලිය යුතු වේ. සමහර අවස්ථාවල ලබාගන්නා මෙම බීජ ඊළඟ කන්නය තෙක් ගබඩා කළ යුතු අවස්ථා ද ඇතිවේ. එහිදී එම බීජවල "ජීව්‍යතාවය" හෙවත් පණ තිබෙන බව එලෙසම රැකගෙන ගබඩා කර ගැනීම ඉතාම වැදගත් වේ. පුරාතනයේ ගොවීන් ධාන්‍ය හා මාංශ බෝග වැනි බීජ හොඳින් අව්වේ වියලා කෘමීන්ට ඇතුළුවිය නොහැකි පරිදි අසුරා තැබීමට පුරුදුව සිටියහ. ඇතැම් අවස්ථාවල විවිධ ගස් වර්ගවල කොළ හා පොතු, අළු වැනි දෑ එකතු කර කෘමීන්ගෙන් වන හානි අඩු කරගත හැකි බවද දැන සිටියහ. එවැනි ක්‍රම අදත් භාවිතාවන නමුත් එවැනි ක්‍රම විශාල වශයෙන් කෙරෙන බීජ නිෂ්පාදන වලදී ප්‍රායෝගිකව කිරීම අපහසු බව පෙනී ගොස් තිබේ. එහෙත් සමහර පළතුරු වර්ග වල බීජ තෙතමනය සහිතව ගබඩා කළොත් පමණක් ඒවායේ ජීව්‍යතාවය පවත්වා ගත හැකි බවද පෙනී ගොස් තිබෙන අතර එවැනි බීජ සඳහා, ඵලවලින් බීජ ඉවත් කළ වහාම ක්ෂේත්‍රයේ සිටුවීම වැනි උපක්‍රම යොදා ගනිමින් මෙම තෙතමන හානිය නිසා ඇතිවන ජීව්‍යතාව ඉවත්වීම වළක්වා ගත හැකි බවට නිර්දේශ ඉදිරි පත් වී ඇත.

බීජ නිෂ්පාදනයේ මූල ධර්ම සම්බන්ධව කථා කරන විට එය සරළ බව පෙනී ගියද, විශාල වශයෙන් වානිජ කර්මාන්තයක් ලෙස කිරීමේ දී මෙයට වඩා ප්‍රායෝගික අපහසුතා තිබෙන බවද සඳහන් කළ යුතුවේ.

## බීජ අංශයේ කාර්යභාරය :

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගුණාත්මක බීජ ගොවීන්ට සැපයීම සේවාවක් ලෙස කරගෙන යයි. ඉතාම අඩු මුදලකට ගොවීන් වෙත සැපයෙන මෙම බීජ, රටේ මුළු අවශ්‍යතාවය සපුරන්නේ නැති වුවද අපේක්ෂා කරන්නේ වසරකට ජාතික අවශ්‍යතාවයෙන් 10% ප්‍රමාණයක්වත් ගුණාත්මක බීජ ලබාදීම වේ. එමෙන්ම එම බීජ ලබාගන්නා ගොවීන් කන්න කීපයක් එම බීජ වල පාරිශුද්ධතාවය රැකගෙන තමන් විසින් හා අසල්වැසි ගොවීන් අතර බෙදාගෙන භාවිතා කරනු ඇතැයි ද දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පර්යේෂණ, බීජ නිෂ්පාදන හා බීජ සහතික කිරීම් අංශ ප්‍රධාන වශයෙන් දායක වෙයි. බීජ නිෂ්පාදන ක්‍රියාවලියේ දී අපට "බීජ පංති" 4 ක් හමුවේ. බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පැහැදිලි කිරිමට මෙම බීජ පංති ගැන අවබෝධයක් ලබා තිබීම වැදගත් වනු ඇත.

## අභිජනන බීජ :

හිතකර ගුණාංග වලින් යුත් පැලෑටියකින් ලබාගත් හෝ දෙමුහුම් කිරීමකින් අභිජනකයා විසින් ලබාගත් බීජ මේ නමින් හැඳින් වේ. මේවායේ පාරිශුද්ධතාවය 100% කි. එනම් කිසිසේත්ම වෙනත් ගුනාංගයන් මිශ්‍රවීම් දක්නට නැත.

## අත්තිවාරම් බීජ :

අභිජනන බීජ වගා කිරීමෙන් පසු ලැබෙන අස්වැන්නට මේ නම යෙදේ. අභිජනන බීජවලින් වන වගාවන් ක්ෂේත්‍රයේ දී හොඳින් පරීක්ෂා කර අසමාන ලක්ෂණ (බලාපොරොත්තු

14 පිටුවට ⇨

ගුණාත්මක බීජ නිෂ්පාදනය...
7 පිටුවෙන්

ගුණාංග නොමැති) පැලැටි ඉවත් කිරීමෙන් මෙහි පාරිශුද්ධතාවය ද, 100% වන සේ රැක ගත යුතු වෙයි.

**ලියාපදිංචි බීජ :**

අත්තිවාරම් බීජ වගා කිරීමෙන් ලැබෙන අස්වැන්නට මෙම නම යෙදේ. මෙහිදී ද ක්ෂෙත්‍ර පරීක්ෂාවෙන් සුදුසු පරිදි පාරිශුද්ධතාවය පාලනය කරගත යුතු වේ.

**සහතික බීජ :**

ලියාපදිංචි බීජ වගා කිරීමෙන් ලැබෙන අස්වැන්න වේ. පාරිශුද්ධතාවය ඉහළ මට්ටමක පවතී. සාමාන්‍ය ගොවීන්ට දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන්නේ මෙම පංතියට අයත් බීජ වේ.

අභිජනන බීජ ලැබෙන්නේ පර්යේෂණ අංශයෙන් ඉතාමත් සුළු ප්‍රමාණයකි. බොහෝ විට එක ශාඛයක අස්වැන්න හෝ පැලැටි කීපයකින් ලැබෙන අස්වැන්න විය හැකිය. මෙවැනි සුළු ප්‍රමාණයක් ජාතික අවශ්‍යාතාවයෙන් 10% අවශ්‍යතාව සපුරාලීම සඳහා ගුණනය කිරීමේ කටයුත්ත බීජ හා රෝපණ අංශයේ ගොවිපලවලින් හා ලියාපදිංචි කළ බීජ ගොවි මහතුන් මාර්ගයෙන් කරනු ලබයි. මේ සෑම පියවරකදීම පාරිශුද්ධතාව රැක ගැනීම සඳහා ක්ෂේත්‍රය පරීක්ෂණයක් බීජ සහතික කිරීමේ අංශයෙන් කෙරෙනු ලබයි.

කෙසේ වුවද අභිජනන බීජ වගාවේ සිට ලියාපදිංචි වගාව දක්වා සෑම පංතියකට අයත් වගාවක්ම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලවල සිදු කෙරෙන අතර, සහතික අංශයේ බීජ නිෂ්පාදනය සඳහා පමණක් ලියා පදිංචි කළ බීජ ගොවීන්ගේ සහාය ලබා ගැනේ. එයට හේතුව පාරිශුද්ධතාවය ඉතා ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහාය. තවද සහතික බීජවල 10% අවශ්‍යතාව ලබාගැනීම සඳහා රජයේ ගොවිපල වල ඇති සීමිත ඉඩම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින්ද මෙලෙස ලියා පදිංචි කොන්ත්‍රාත් බීජ ගොවීන්ගේ සහය ලබා ගැනීමට සිදු වේ. මුළුමනින්ම නිෂ්පාදනය වන බීජ ප්‍රමාණ නිසි වේලාවට ගොවීන් අතරට පත්කිරීම හෙවත් අලෙවි ක්‍රියාවලිය ද බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයෙන්ම සිදු කෙරේ. මෑතක සිට රජයේ ප්‍රතිපත්තියක් අනුව, ගුණාත්මක බීජ සැපයීමේ දුෂ්කර එහෙත් වැදගත් කාර්යය සඳහා පුද්ගලික අංශය ද හවුල් කරගෙන සිටී. දැනටමත් විශාල සමාගම් කීපයක් මේ සඳහා ඉදිරිපත් වී ඇති අතර අනාගතයේ දී ඒ ලැබෙන සහයෝගයෙන් මෙයටත් වඩා සාර්ථක ලෙස ගුණාත්මක බීජ ලබාදී රටේ කෘෂිකර්මාන්තයට දායක වීමට අපට හැකිවනු ඇත.